**මහනුවර මහා නගර සභාව**

මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත
අවමංගල්‍ය ශාලා කම්කරු සේවය ලබාගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත අවමංගල්‍ය ශාලා කම්කරු සේවය ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.08.14 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| 1. | තනතුරු සංඛ්‍යාව | : | තනතුරු 01 |
| 2. | වයස | : | සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. |
| 3. | දීමනාව | : | දෛනික දීමනාව රු. 1,333.33 කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතු ය) |
| 4. | අධ්‍යාපන සුදුසුකම් | : | 5 ශ්‍රේණිය සමත්ව තිබීම |
| 5. | වෘත්තීය සුදුසුකම් | : | ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැලකේ. |
| 6. | තෝරා ගැනීමේ ක්‍රමය | : | අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ. |

සේවාව සපයා ගැනීමට තෝරා ගනු ලබන නිලධාරීන් පහත කොන්දේසි වලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ :-

1. සෑම දිනකම උදෑසන හා රාත්‍රී වශයෙන් සේවා මුර 2ක් ක්‍රියාත්මක වේ. සේවා අවශ්‍යතාවය මත ලබාදෙන ඕනෑම සේවා මුරයක රාජකාරි කිරීමට එකඟ විය යුතු ය.
2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතු ය.
3. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා දිනයන්හි සේවයේ යෙදිය යුතු අතර, සුවිශේෂී රාජකාරි සඳහා ඉරිදා හා රජයේ නිවාඩු දිනයන්හි සේවය සැපයීම සඳහා කැඳවනු ලැබිය හැක. එවන් අවස්ථාවන් හි දී උක්ත මාසික දීමනාවට යටත්ව සේවය සැපයීම සිදු කල යුතු වේ.
4. සේවා සැපයීමට අදාල අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර, සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

7. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය. මහනුවර නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවකු විය යුතු ය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
- කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍යා විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ය චරිතයකින් යුක්ත විය යුතු ය.

**සටහන :** මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර , සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරී අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 ජූලි මස 31 දින.